www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නේපාලයේ පාර්ලිමේන්තුව තුල විශාලතම කන්ඩායම ලෙස මාවෝවාදීන් ඉස්මතුවෙයි

**Maoists emerge as largest parliamentary bloc in Nepal**

**ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි**
**2008 අප්‍රේල් 25**

ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක් සඳහා අප්‍රේල් 10 පැවැති මැතිවරනයේ ප්‍රාදේශීය ප්‍රතිඵල ඊයේ නිවේදනය කිරීමෙන් පසුව මාඕවාදී නේපාල කොමියුනිස්ට් පක්ෂය - (නේකොප-මාඕවාදී) පැහැදිලි ජයග්‍රාහකයා වූයේ ය. සෘජුව තෝරා පත් කර ගනු ලබන ආසන 240න් 120ක් ද, සමානුපාත පදනමක් මත තෝරාපත් කරගනු ලබන ආසන 335න් 97ක් ද දිනා ගැනීමට මාඕවාදීහු සමත් වූහ. මාඕවාදී කොමියුනිස්ට් පක්ෂය ලැබූ සමස්ථ ඡන්ද ප්‍රතිශතය 29.27කි.

ආසන 601ක් සහිත ව්‍යවස්ථා සම්පාදක මන්ඩලය තුල තනි බහුතර බලයක් නැති නමුදු මාඕවාදී කොමියුනිස්ට් පක්ෂය ඔවුන්ගේ ආසන්නතම ප්‍රතිවාදීන්ට වඩා බොහෝ ඉදිරියෙන් සිටිති. නේපාල කොන්ග්‍රස් පක්ෂයට (නේකොප) සහ නේපාල කොමියුනිස්ට් පක්ෂය - එක්සත් මාක්ස් ලෙනින්වාදී (නේකොප-එමාලෙ) සෘජුව තෝරා පත් කර ගනු ලබන ආසනවලින් පිලිවෙලින් ලබාගැනීමට සමත් වූයේ ආසන 37ක් සහ ආසන 35කි. එහෙත් සමානුපාතික පදනම යටතේ පිලිවෙලින් 21.14 සහ 20.33 ඡන්ද ප්‍රතිශතයක් ලබා ගැනීමට ඔවුහු සමත් වූහ. ඒ අනුව නේපාල කොන්ග්‍රසයට ආසන 107 සහ මාක්ස් ලෙනින්වාදී කොමියුනිස්ට් පක්ෂයට ආසන 101 ලැබෙනු ඇත.

පිලිවෙලින් සියයට 6.32 සහ සියයට 3.16ලබා වාර්ගික සුලු කන්ඩායම් මත පදනම් වූ කන්ඩායම් දෙක - මදෙසි ජනතාවගේ අයිතීන් පිලිබඳ සංසදය සහ මදේස් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ඊලඟට විශාලතම ජාතික ඡන්ද ප්‍රමානය ලබා ගැනීමට සමත් වූහ. ඒ අනුව ඔවුන්ට ලැබෙන මුලු ආසන සංඛ්‍යාව 51 සහ 20 වනු ඇත. කාන්තාවන්, කුලහීන සහ වාර්ගික සුලුතර ජන කන්ඩායම් සඳහා ආසන සංඛ්‍යාවක් වෙන් කෙරෙන නිසා සුලු වශයෙන් වෙනසක් එක් එක් පක්ෂය සඳහා වෙන්කරනු ලබන අවසාන සමානුපාතික ආසන සංඛ්‍යාව තීරනය කිරීමේ දී සිදු වනු ඇත. ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයේ ඉතිරි ආසන 26 කට ඇමති මන්ඩලය පිහිටුවීමෙන් පසු එහි නියෝජිතයන් විසින් තෝරාපත් කරනු ලබයි.

අර්ථභාරීව ම, ගයනේන්ද්‍ර රජුට සහ රාජාන්ඩුව බලයේ තබා ගැනීමට සහය දක්වන රාජාන්ඩුවාදී පක්ෂ තුන මුලුමනින්ම වාගේ පරාජයට පත් වූහ. සෘජුව තෝරා පත් කර ගනු ලබන ආසනවලින් එකක් වත් මෙම පක්ෂවලට දිනා ගැනීමට නොහැකි වූ අතර ඔවුන්ට ලැබුනේ සමානුපාතික ආසනවලින් අතලොස්සක් පමනි. මෙම පක්ෂ තුනෙන් වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලැබුනේ රාෂ්ට්‍රීය ප්‍රජාතන්ත්‍ර පක්ෂයට ය. එම සංඛ්‍යාව මිලියනයකට වඩා පාවිච්චි කල ඡන්දවලින් 263,431 හෙවත් සියයට 2.45කි. ඒ අනුව ඔවුන්ට ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයේ ආසන 8 හිමිවනු ඇත.

නේපාල කොන්ග්‍රසය සහ එක්සත් මාක්ස් ලෙනින්වාදී නේපාල කොමියුනිස්ට් පක්ෂය විසින් නායකත්වය දුන් පක්ෂ හතේ අන්තර්කාලීන සභාග ආන්ඩුවකට බලය පැවරීමට රජුට බල කෙරුන 2006 අප්‍රේල් මාසයේ මහජන විරෝධතා ප්‍රකුපිත කිරීමට තුඩු දුන් මහජන ඡන්දයෙන් තේරී පත් නොවූ සහ ගයනේන්ද්‍ර විසින් පත් කල අමාත්‍යමන්ඩලය තුල රාජාන්ඩුවාදී දේශපාලනඥයෝ ප්‍රමුඛ තැනක් ඉසුලූහ. රාජාන්ඩුව සහ සම්ප්‍රදායික පක්ෂ කෙරෙහි පුලුල්ව පැතුරුනු විරුද්ධත්වයත් ඉහල නගින ආහාර මිල විසින් අවුලුවාලන, ගැඹුරුවන්නා වූ සමාජ අර්බුදයත් මාඕවාදීන් සඳහා විශාල ඡන්ද සංඛ්‍යාවක් ලැබීමට දායක විය.

මාඕවාදී කොමියුනිස්ට් පක්ෂ නායක පුෂ්පා කමල් ධාල් හෙවත් ප්‍රචන්ඩ ඊයේ මෙසේ ප්‍රකාශ කලේ ය. "ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයේ ප්‍රථම රැස්වීමේදී ම රාජාන්ඩුව අහෝසි කර සමූහාන්ඩුවක් ස්ථාපිත කරනු ඇත. ඒ කාරනයේ දී සම්මුතියක් නැත" මැතිවරනයට සහභාගිවීමේ කොන්දේසියක් ලෙස සමූහාන්ඩුවක් ස්ථාපිත කිරීමේ සංශෝධනයක් ගැන පසුගිය දෙසැම්බර් මාසයේ දී මාඕවාදීහු අවධාරනය කලහ. බලයට පත්වන ව්‍යවස්ථා සම්පාදක මන්ඩලය විසින් සංශෝධනයකින් තොරව අවසන් අනුමතිය සඳහා ඡන්දය දීමට නියමිත ය.

මාසයක් ඇතුලත ඉල්ලා අස් නොවුනොත් දඬුවම් කිරීමේ පියවරයන්ට මුහුන දීමට රජුට සිදුවනු ඇතැයි ප්‍රචන්ඩ කලින් අවසාන නිවේදනයක් නිකුත් කලේ ය. ඒ සමග ම "ගෞරවාන්විතව" ඉවත් වීමට, සාමාන්‍ය පුරවැසියකු ලෙස ජීවත් වීමට සහ ඔහුගේ සියලු ම පුද්ගලික දේපල සහ ව්‍යාපාර ඔහු සංතකයෙහි තබා ගැනීමට ගයනේන්ද්‍රට ඉඩ සලසන බව ද මාඕවාදී කොමියුනිස්ට් පක්ෂය විසින් ඇඟවුම් කර තිබේ. රජු සමග සාකච්ඡා කිරීමට ඔහුගේ පවතින කැමැත්ත ප්‍රචන්ඩ විසින් ප්‍රකාශ කර ඇත.

ඔහුගේ ආඥාදායක පාලන විධික්‍රම සහ ඔහුගේ සහෝදරයා වූ බිරෙන්ද්‍ර රජුගේ මරනයට තුඩු දුන් 2001 රජ මාලිගාවේ සිදුවූ අරුම පුදුම ඝාතනයට ඔහු සම්බන්ධ බවට පවතින කටකතා නිසා ගයනේන්ද්‍ර සුවිශේෂව ගර්හාවට පාත්‍ර වූවෙකි.

විශාල ආසන සංඛ්‍යාවකට හිමිකම් කියන නමුත් නව ආන්ඩුවක් පිහිටුවීමේ දී මාඕවාදීහු බාධකවලට මුහුන පා සිටිති. නේපාල කොන්ග්‍රසය සහ එක්සත් මාක්ස් ලෙනින්වාදී නේපාල කොමියුනිස්ට් පක්ෂය මෙන්ම මදෙසි ජනතාවගේ අයිතීන් පිලිබඳ සංසදය ද ඇතුලුව පක්ෂ හතේ සන්ධානය මැදිහත් කරගත් පලල් සභාගයක් සඳහා මාඕවාදීන් ආයාචනා කර ඇත. එහෙත්, නේපාල කොන්ග්‍රසය සහ මාක්ස් ලෙනින්වාදී නේපාල කොමියුනිස්ට් පක්ෂය ඔවුන් අඩු ලංසුවට වැටෙනු ඇතැයි යන භීතිය නිසා මාඕවාදීන් විසින් ආධිපත්‍යය දරන ආන්ඩුවකට සම්බන්ධ වීමට අකැමැත්තක් පෙන්වති.

නේපාල කොන්ග්‍රසයේ නායකයකු වන ශේකර් කොයිරාල අඟහරුවාදා ජනමාධ්‍යවලට මෙසේ ප්‍රකාශ කලේ ය. ආන්ඩුවට සම්බන්ධවීමේ "ප්‍රශ්නය මත කොන්ග්‍රස් නායකයන් තියුනු ලෙස බෙදී ඇත". පක්ෂය ආන්ඩුවට සම්බන්ධ වන්නේ මාඕවාදීන් "අත්පත් කර ගත් සියලු ම දේපල ආපසු බාරදීම සහ සමාන්තර රාජ්‍ය යාන්ත්‍රනය විසුරුවා හැර සාම ගිවිසුමට දැඩිව බැඳී ගත්තොත් පමනක් බව" ද ඔහු පැවසීය. ඔහු " සමාන්තර රාජ්‍ය යාන්ත්‍රනය" යනුවෙන් අදහස් කලේ කුමක් දැයි විස්තර නොකල නමුත් එය මැතිවරන ප්‍රචන්ඩ ක්‍රියා සම්බන්ධව චෝදනාවට ලක් වී ඇති මාඕවාදී තරුන කොමියුනිස්ට් ලීගය බව පෙනෙන්නට තිබේ.

පක්ෂ හතේ සන්ධානයෙන් ඉවත් වන බව එක්සත් මාක්ස් ලෙනින්වාදී කොමියුනිස්ට් පක්ෂය නිවේදනය කලේ ය. "නව ව්‍යවස්ථාව මත එකට වැඩ කිරීමේ එකඟතාවක් පක්ෂ හතේ සන්ධානය තුල තිබේ. අපි එසේ වැඩ කරන්නෙමු" යැයි පක්ෂයේ නායක ප්‍රදීප් නේපාල් ප්‍රකාශ කලේ ය. එහෙත් එය ආන්ඩුව තුල මෙන්ම ආන්ඩුවෙන් පිටින් සිටිමින් කල හැකි බව ද ඔහු කීවේ ය.

සාපේක්ෂව සුලුතර පක්ෂයක් ලෙස බලයට පත්වන ආන්ඩුවට මාඕවාදීන් සම්බන්ධ වනු ඇතැයි ගනන් බැලූ නේපාල කොන්ග්‍රසය සහ එක්සත් මාක්ස් ලෙනින්වාදී කොමියුනිස්ට් පක්ෂය ඡන්ද ප්‍රතිඵලවලින් කම්පනයට පත් වූහ. දිග් ගැස්සුන ගරිල්ලා යුද්ධය අවසන් කිරීමට, ආයුධ බිම තබා ඔවුන්ගේ සටන්කරුවන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් අධීක්ෂනය කරනු ලබන කඳවුරුවලට ගාල් කිරීමේ ගිවිසුමකට 2006 නොවැම්බර් මාසයේ එලඹීමෙන් පසු මාඕවාදීහු පලමුවෙන් සභාග ආන්ඩුවට ඇතුලු විය.

මාඕවාදීන් විසින් ආධිපත්‍යය දරන ආන්ඩුවක් කෙරෙහි හමුදාව කෙසේ ප්‍රතිචාරය දක්වනු ඇත්දැයි දැක ගැනීමට මඳක් බලා සිටිය යුතු ය. එහි සටන්කරුවන් හමුදාවට අන්තර්ග්‍රහනය කරන ලෙස මාඕවාදීහු ඉල්ලති. එහෙත් එවැනි පියවරකට හමුදාව මුලුමනින්ම විරුද්ධ වී ඇත. "හමුදාව අදේශපාලනික සංවිධානයක් වන අතර මෙම සුවිශේෂ ගුනාංගයට සියලු ම පාර්ශව ගරු කල යුතු ය"යි හමුදා ප්‍රකාශක රමින්ද්‍ර චෙට්රි මේ සතියේ යලි අවධාරනය කලේ ය. ඇත්ත වශයෙන්ම රාජාන්ඩුවේ කොඳුනාරටිය වූයේ හමුදාව ය. ජීවිත 13,000 බිලිගත් 1996 ආරම්භ කල සිවිල් යුද්ධ කාල පරිච්ඡේදය තුල එහි මර්දනකාරී විධික්‍රම සම්බන්ධයෙන් හමුදාව කුප්‍රකට ය. ඔවුන්ගේ උත්සුකතාවයන් සුරක්ෂිත බව නේපාල පාලක ප්‍රභුවට සහ ප්‍රධාන බලයන්ට සහතික කිරීමට ආන්ඩුව පිහිටුවීමට පෙර ම මාඕවාදීන් උවමනාවටත් වඩා අනුගත වී ඇත.

මාඕවාදී නායකයෝ බදාදා දෙවන වරටත් නේපාල වෙලඳ සහ කර්මාන්ත මන්ඩලයේ නියෝජිතයන් හමුවූහ. ප්‍රචන්ඩ ධනවාදය සහ විදේශ ආයෝජන සඳහා පක්ෂයේ සහයෝගය එහි දී යලි වතාවක් ප්‍රකාශ කලේ ය. "මාඕවාදීන් දේශීය ආයෝජන සඳහා පලමුව මුල්තැන දෙන නමුත් රටතුලට එන විදේශ ආයෝජන අපගේ පක්ෂය හෘදයාංගමව පිලිගන්නෙමු."

*ද හිමාලයන් ටයිම්ස්* සඟරාවට අනුව මාඕවාදී කොමියුනිස්ට් පක්ෂයේ සභාපති "වෘත්තීය සමිති (ක්‍රියාකාරකම්) ලෙස මවා පෑම යටතේ අතීතයේ දී අපගේ පක්ෂය කර්මාන්තයන්හි වැඩ කටයුතු අඩාල කල නමුත් අනාගතයේ දී එසේ නොවන බවට ව්‍යාපාරික ප්‍රජාවට යලි සහතික විය." තවත් ජ්‍යෙෂ්ට මාඕවාදී නායකයෙකු වූ බාබුරාම් භට්ටාරායි රට තුල "ආර්ථික විප්ලවයක" මූලිකත්වය ගැනීමට පුද්ගලික අංශයට ආරාධනා කලේ ය.

එක්සත් ජනපද ත්‍රස්තවාදී ලැයිස්තුවෙන් තමන්ගේ නම ඉවත්කරවා ගැනීමට මාඕවාදීන්ට අතිශයින්ම තීරනාත්මක ය. මාඕවාදී පක්ෂයේ ජාත්‍යන්තර බියුරෝවේ නායකයා ගුජුරෙල් සඳුදා වොෂින්ටනයට මෙසේ ආයාචනා කලේ ය. "එක්සත්

ජනපදයත් සමග සමීප සම්බන්ධතා ගොඩනගා ගැනීමට උත්සාහ කරමින් සිටිමු. මේ සම්බන්ධයෙන් පෙරමුනු කිහිපයක සාකච්ඡා සිදුවෙමින් තිබේ. ඔවුන්ට අපව අවශ්‍යනම් සියලු ම එක්සත් ජනපද නිලධාරින්ට කථා කිරීමට අපගේ දොරටු සෑම විටම විවෘතව ඇත."

නේපාලයේ එක්සත් ජනපද තානාපති නැන්සි පවෙල් බ්‍රහස්පතින්දා මාඕවාදී නායකයන් සමග ආධාරදෙන රටවල සහ ආයතනවල රැස්වීමකට සහභාගි වූ නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු අදහසක් ප්‍රකාශ නො කලා ය. මාඕවාදීන් ත්‍රස්තවාදී ලැයිස්තුවෙන් ඉවත් කිරීම සම්බන්ධව ක්ෂනික පියවර ගෙන නැත. " කිසියම් ව්‍යාපාරයක් ත්‍රස්තවාදය සමග පවතින සම්බන්ධය අවසන් කරන්නේ නම්" වොෂින්ටනය ඒ ගැන සලකා බලනු ඇතැයි පමනක් ප්‍රකාශ කරමින් එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රකාශක ටොම් කැෂී ද ඒ ගැන අදහස් ප්‍රකාශ කිරීමෙන් සඳුදා වැලකී සිටියේ ය.

එක්සත් ජනපද මූලෝපායාත්මක උත්සුකතාවයන් සඳහා මාඕවාදීන් ආධිපත්‍යය දරන ආන්ඩුවක් තව දුරටත් යොදා ගත හැකි දැයි ගනන් බැලීමට බුෂ් පරිපාලනය උත්සාහ කරමින් සිටින බව නිසැකය. මෑත වසරවල දී කත්මන්ඩුවලට එක්සත් ජනපද මැදිහත්වීම තීව්‍ර කල අතර චීන බලපෑම ප්‍රතිමුඛ කිරීමේ කොටසක් ලෙස නේපාල හමුදාවට ආයුධ සම්පාදනය කලේ ය. මාඕවාදී කොමියුනිස්ට් පක්ෂයේ ස්වාභාවික මිතුරෙක් වනවා වෙනුවට මාඕවාදීන් තලා දැමීම සඳහා රාජාන්ඩුවට ආයුධ සම්පාදනය කරමින් සහයෝගය දීමෙන් පසුව බෙයිජිනය එහි මූලෝපායන් යලි තක්සේරු කරමින් සිටියි.

නේපාල නාගරික ජනයා සහ දිලිඳු ගැමියන් මුහුන දෙන දරුනු කොන්දේසි ඔවුන් විසින් සමනය කරනු ඇතැයි බලාපොරොත්තු වෙමින් දශලක්ෂ සංඛ්‍යාත ඡන්ද දායකයෝ මාඕවාදීන්ට ඡන්දය දුන්හ. එහෙත් මාඕවාදීහු දැනටමත් ඔවුන්ගේ බලාපොරොත්තු වලලා දැමීමට උත්සාහ කරමින් සිටිති. මාඕවාදී කොමියුනිස්ට් පක්ෂයේ නායකයකු වන රාම් බහදූර් තාපා බඩුමිල ඉහල යාම ජාත්‍යන්තර වෙලඳපොල බලවේග විසින් තීන්දු කෙරෙන නිසා එය ආන්ඩුවේ පාලනයෙන් පරිබාහිරව සිදුවන බව ද *හිමාලයන් ටයිම්ස්* සඟරාවට ප්‍රකාශ කලේ ය. ග්‍රාමීය නය සහන සැලසීම සීමා කෙරෙනු ඇත. "පීඩිතයන්ගේ නය සම්පූර්නයෙන් අතහැර නොදමන නමුත් අධික නය නිසා දේපල අහිමි වීමේ අද්දර ඉන්නවුන්ගේ නය සම්පූර්නයෙන් කපාහැරීමට අප උත්සාහ කරන" බව ඔහු පැවසී ය.

ජනගහනයෙන් සියයට 30කට වඩා දරිද්‍රතා රේඛාවෙන් පහල කොන්දේසි යටතේ ජීවත්වන තතු තුල මාඕවාදීන්ගේ ව්‍යාපාරික ගැති පිලිවෙත්වල ප්‍රතිඵලයක් ලෙස කල් නොයවා ම පුපුරන සුලු දේශපාලන ආදීනව ඇති කිරීමට නියමිත ය.

© www.wsws.org